# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1994/74 - 2016 නොවැම්බර් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2016.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/13 හා 2015.09.21 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් මා භාරයට පමුණුවන්නා වූ කාන්තා හා ළමා කටයුතු විෂය හා කාර්යයන් අතරින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ 5 වැනි අනුව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් පහත උපලේඛනයේ සඳහන් විෂයන් හා කාර්යයන් ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යවරිය වෙත පවරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඩී. එම්. චන්ද්‍රානි බණ්ඩාර,
කාන්තා හා ළමා කටයුතු අමාත්‍ය.

2016 නොවැම්බර් මස 23 වැනි දින,
සෙත්සිරිපාය 11 වන අදියර,
6 වන මහල,
බත්තරමුල්ල,
කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

01. ශාරීරික හා මානසික වශයෙන් නීරෝගී දරුවකු ඇති කරලීමේ අභිප්‍රායෙන් සම්පාදිත මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳව ප්‍රතිපත්ති, වැඩ සටහන්, අධීක්ෂණය කිරීම හා පළාත් මට්ටමේ කමිටු සමග සම්බන්ධීකරණය, සමායෝජනය සහ පසු විපරම් කිරීම.

02. ගර්භණී මාතාවන්ට රු. 20,000/- ක් වටිනා පෝෂ්‍යදායී ආහාර ලබා දීමේ විශේෂ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

03. වයස අවුරුදු 3-5 ත් අතර දරුවන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබා දීමේ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

12 - 481


1A - G 24648 — 358 (2016/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*